

# පුංචි සමනළයා

උපන්යා ඉන්ජල් ගුණසේකර

# පෙරවදන

වත්මන් අධ්‍යාපනයෙන් එලදායී පුරවැසියෙකු සතුටින් ජීවත්වන පවුලක් මෙන් ම ප්‍රඥාසම්පන්න දැනුමෙන් යුත් බහුවිධ කුසලතාවන්ගෙන් සපිරි පුරවැසියන් සහිතසමාජයක් ගොඩ නැගීම අපේක්ෂාව යි එසේ නම් පාසලට වගකීම් පවරන දරුවාගේ විභවතා හඳුනාගෙන ඒවා ඔපවත්කිරීම තුළින් ගෝලීය සමාජයට ගැළපෙන ලෙස හැඩගැස්වීම අපගේ වගකීමයි එම ජාතික අරමුණු මෙන්ම පාසලේ දර්ශනයට අනුව යමින් අපගේ මගපෙන්වීම යටතේ ලේඛනකරණය සහජයෙන් උරුමකරගත් මහාමායා දියණියන් වසර ගණනාවක් සිට විවිධ අරමුණු පෙරදැරිකොට ගෙන ග්‍රන්ථකරණයට යොමුකිරීමේ ප්‍රතිඵලයක් ලෙස දේශීය සාහිත්‍ය කෙතේ ලේඛක අංකුර දහස් ගණනක් වැපිරීමට ලැබීම පාසලක් වශයෙන් ලැබූ සුවිශේෂ ජයග්‍රහණයක් මෙන්ම කාලීන ජාතික අවශ්‍යතාවයක් සපුරාලීමකි .

එහි ඉදිරි දිගුවක් ලෙස පාසල තුළ ගොඩනැගී ඇති පොත් ලිවීමේ සංස්කෘතිය මෙවර ඩිජිටල් තාක්ෂණික යුගයේ ස්මාර්ට් දරුවනට ගැළපෙන ලෙස නවීකරණයකරමින් "දිවිය දිනන විද්‍යුත් පොතක් "ව්‍යාපෘතිය හඳුන්වාදෙන ලදි දරුවන්ට අත්දැකීම් සමුදායක් මෙන්ම ගත්කතුවරයෙකුවීම හරහා ජීවිතයට එකතුවන වටිනාකම සළකා අධ්‍යාපන අමාත්‍යංශ අනුමැතියෙන් රටේ ම පාසල් දරුවන් අතර විද්‍යුත් පොතක් ලියන්නට සිහින දකින දරුවන් සහෝදරත්වයෙන් අප හා එක්වීම අගයකරමි.

**2023** සාහිත්‍ය මාසයට සමගාමී ව අප පාසල විසින් සංවිධානය කළ "දිවිය දිනන විද්‍යුත් පොතක් "ව්‍යාපෘතියට එක්වූ පුංචි ලේඛක ලේඛිකාවන්ට මෙම කෘතිය තුළින් ලැබුණු අත්දැකීම් ඉදිරි අධ්‍යාපනයට මෙන්ම අනාගත දිවියට ශක්තියක් වේවා යි ප්‍රාර්ථනා කරමු.

මෙම ව්‍යාපෘතිය වෙනුවෙන් සහාය දැක්වූ අප පාසලේ කලමනාකරණ මණ්ඩලය
ගුරුභවතුන් දෙමාපියන් ආදි ශිෂ්‍යාවන් සෙසු පාසල් වල දරුවන් යොමුකළ විදුහල්පතිවරුන් ගුරුභවතුන් මෙන්ම නන් අයුරින් උදව් උපකාර කළ සැමට හෘදයාංගම ස්තුතිය මෙමගින් පිරිනමමි.

ශෂිකලා සේනාධීර
විදුහල්පතිනිය
මහාමායා බාලිකා විද්‍යාලය – මහනුවර
**2023 . 11 . 01**

# පුංචි සමනළයා

උපන්‍යා ඉන්ජල් ගුණසේකර

# පිදුම

සිප්සතර හැදෑරීමට මහාමායා විදුබිමට පැමිණ අත්පොත් තැබූ මා හට සිප්සයුරේ කිමිද සියල්ල අතැඹුලක් සේ දැනගැනීමටත් යහපත් මහාමායා දියණියක් සේ මාගේ ජීවිතය අර්ථවත් කර ගැනීමටත්, ගුරුමෑණියනි, ඔබතුමියගේ ඔවදන් සහ මඟපෙන්වීම මහත් පිටිවහලක් විය.

එසේ හෙයින් මාගේ පන්තිභාර ගුරු මෑණියන් වන රේණුකා රාජපක්ෂ ගුරු මෑණියන්ට තුති සිතින් ඉතා ගෞරවණීය ලෙස මාගේ මේ පොත් පිංච පුදමි.

# ස්තූතිය

මා විසින් මුල්වරට ලියන ලද "පුංචි සමනලයා" නම් මෙම කෘතිය සාර්ථකව නිම කිරීම සඳහා මාහට ගුරුහරුකම් දෙමින් මාව දිරිමත් කල මාගේ ආදරණිය දෙමාපියන්ටත් මාගේ විදුහලේ විදුහල්පතිතුමියන් දෙපළටත් මාගේ පන්තිභාර ගුරුතුමිය වන රේණුකා රාජපක්ෂ ගුරුමෑණියන්ටත් මෙම කෘතියේ චිත්‍ර ඇඳ එය වර්ණවත් කර ගැනීමට මඟ පෙන්වූ රවින්ද්‍ර කුමාර ගුරු පියාණන්ටත් මෙම කෘතිය සාර්ථකව නිම කර ගැනිම සඳහා නන් අයුරින් අතහිත දුන් සැමටත් මාගේ ගෞරවාදර ස්තූතිය මෙයින් පුද කරමි.

උපන්යා ඉන්ජල් ගුණසේකර
2 ශ්‍රේණිය
මහාමායා බාලිකා විදුහල

එක කැලේක ලස්සන සමනලයෙන් රෝස මලක පැණි බොන්න ආවා. එයාට යාළුවෝ ගොඩක් ඉන්නවා. එක දවසක් මේ සමනලයාට ලස්සන සමනල පැටියෙක් ඉපදුණා. මේ සමනල පැටියා වෙනස් මෙයාට පාට පාට ලොකු තටු දෙකක් තිබුණා.



සමනල අම්මාට මේක හිතා ගන්න බැහැ. ඉතින් සමනල අම්මා එයාගේ පැටියාගෙන් ඇහුවා.
''ඔහොම මොකද ඔයා ඉපදුන හැටියෙම මෙච්චර ලස්සන තටු ආවේ'' කියලා ඊට පස්සේ සමනල පැටියා කිවුවා,
''මම දිව්‍ය ලෝකේ සිට ආවේ, ඉතින් මට ඕන වේලාවක ලස්සන ලොකු



තටු ලබා ගන්න පුළුවන්''
කියලා, ඉතින් සමනල
අම්මාට හරි සතුටුයි,
තමාගේ පැටියා ඉස්සර දිව්‍ය
ලෝකයේ සිටි කෙනෙක්



නිසා, මොකද දිව්‍ය ලෝකයට යන්නේ හොඳ වැඩ කරන පවු නොකරන අයයි.

ඔන්න දවසක් සමනල අම්මාට හොඳටම ලෙඩ හැදුණා.

ඉතින් සමනල අම්මා ඒ
අසනීපයෙන් මිය ගියා.
සමනල පැටියාට හරිම දුකයි.
ඉතින් සමනල පැටියා කිව්වා
"මම හොඳ වැඩ පිං වැඩ
කරලා තියෙන නිසා, මගේ

අම්මාට නැවත ජීවිතය ලැබේවා.'' කියලා
ඊට පස්සේ සමනල
පැටියාගේ හොඳ වැඩ නිසා
සමනල අම්මාට නැවත පණ

ආවා. ඊට පස්සේ ඒ ගොල්ලෝ සතුටින් ජීවත් වුණා.

නිමි.

# පසුවදන

නූතන තාක්ෂණික මෙවලම් භාවිතයට එකතුවීමත් සමග සිදුවන සමාජ ආර්ථික පරිවර්තනයන් හේතුකොටගෙන පොත පතින් දුරස්වන පාසල් දරුවන් නැවත පොත පතට සමීප කරවීම හරහා අධ්‍යාපනයේ ගුණාත්මක වර්ධනයක් ඇතිකිරීම ඔවුන්ගේ සාහිත්‍යය නිර්මාණ හැකියාවන් ඔප්නැංවීම තුළින් රටේ සාහිත්‍ය ප්‍රබෝධයක් ඇතිකිරීම වැනි බහුවිධ පරමාර්ථ ඇතිව 2014 වසරේ දී මා විසින් අධ්‍යාපන අමාත්‍යංශයට පෞද්ගලික යෝජනාවක් ලෙස පාසල් දරුවන් ග්‍රන්ථ කරණයට යොමුකරන ක්‍රියාමූලික පර්යේෂණ ව්‍යාපෘතිය හඳුන්වාදෙන ලදී. ඒ යටතේ වැඩි ම ග්‍රන්ථ ප්‍රමාණයක් රචනා කරමින් වාර්තාවක් තබන්නේ මහාමායා පුංචි ගත්කතුවරියන් ය. පාසල තුළ ගොඩනැගී ඇති ලේඛන සංස්කෘතිය නව මාවතකට යොමුකරමින් රටේ සෙසු පාසල් දරුවන් හා එක්ව මෙවර ජාත්‍යන්තර පාඨකයන් වෙත ලඟාවීමට නූතන තාක්ෂණය හා බැඳුණු විද්‍යුත් කෘති රචානා කරන්නට විය ඒ තුළින් සම්පාදනය වූ මෙම විද්‍යුත් කෘතිය දරුවන්ට අත්දැකීම් සමුදායක් ලබාදෙමින් අධ්‍යාපනයේ ගුණාත්මක දියුණුවට ඉවහල්වන අතර ම ඔවුන්ගේ හැඟීම් දැනීම් නිර්මාණාත්මක හැකියාවන් ශාස්ත්‍රීය හික්මීම ප්‍රදර්ශනයකරන කැඩපතකි. මෙම නිර්මාණ රටේ අධ්‍යාපනයේ දිශානතිය මෙන්ම
සමාජ ප්‍රගමනයට මගපෙන්වන නිසා ප්‍රතිපත්ති සම්පාදකයින් සහ සැළසුම්කරුවන්ට මෙන්ම සමාජයේ වගකිවයුතු පාර්ශවයන්ට ආලෝකයක් සපයයි පාසල් මට්මින් ආරම්භකර ජාතික තලය දක්වා විවිධ අභියෝග මැද පැමිණි මෙම ව්‍යාපෘතියේ පීවය වූයේ මහාමායා දියණියන් සහ පාසල් ප්‍රජාව බව ගෞරවයෙන් සිහිපත් කරමි.

දිවිය දිනන විද්‍යුත් පොතක් ව්‍යාපෘතියට මහාමායා දියණියන් සමග එක්ව විද්‍යුත් කෘතියක් රචනාකර ජනගතකරන්නට ඩිජිටල් වේදිකාවට පිවිසි ගත්කතු අංකුර ඔබට ලෝකය දිනන ගත්කතුවරයෙකු වීමට ශක්තිය ලැබේවායි පතමු . .


මෙයට
සෙනෙවිරත්න මහලේකම්
පාසල් දරුවන් ග්‍රන්ථකරණයට යොමුකළ ව්‍යාපෘතියේ නිර්මාපක
2023 . 11 . 01



9 786242 066134
ISBN 978-624-206-613-4